බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

**External Degrees and Extension Courses Unit**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**University of Sri Jayewardenepura**

මගේ අංකය / My Number: USJP/ EEX - 13
ෆැක්ස් / Fax:

ඔබේ අංකය / Your Number:
වෙබ් අඩවිය / Website: www.external.sjp.ac.lk

දුරකථනය / Telephone: 011-2801481, 011-3132496
විද්‍යුත් තැපැල / E-mail: info.ext@sjp.ac.lk


2022/05/23

ප්‍රිය ශිෂ්‍ය/ ශිෂ්‍යාව

**විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව**
**ශිෂ්‍ය ලියාපදිංචිය දීර්ඝ කිරීම - 2016 ශිෂ්‍ය කණ්ඩායම**

2016 අධ්‍යයන වර්ෂය සඳහා විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ ඔබගේ එම ලියාපදිංචි කාල සීමාවට අදාළ සියළුම පරීක්ෂණ දැනට පවත්වා අවසන් කර ඇත. ඒ අනුව 2016/11/01 සිට 2019/10/31 දක්වා වූ එම ලියාපදිංචි කාල සීමාව තුල ඔබට උපාධිය සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී තිබේ නම් හා තව දුරටත් පුනර් අපේක්ෂකයෙකු ලෙස අධ්‍යයන කටයුතු කරගෙන යාමට අවශ්‍ය වන්නේ නම් එම ලියාපදිංචිය දීර්ඝ කරගත යුතුය.

පරීක්ෂණ සඳහා අයදුම් කිරීමට පෙර ලියාපදිංචිය දීර්ඝ කර ගත යුතුය. ඒ සඳහා නියමිත අයදුම්පත සහ මුදල් ගෙවිය යුතු ගිණුම් අංකය **external.sjp.ac.lk (Registration Renewal)** යන අපගේ වෙබ් අඩවියට පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය යෙදීමෙන් බාගත (Download) කරගත හැක. ලියාපදිංචිය දීර්ඝ කිරීම සඳහා එක් එක් අයදුම්කරුවන් වෙනුවෙන් වෙන වෙනම ගිණුම් අංක ලබා දී ඇති බැවින් ඔබට අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කල යුතුය. ඒ අනුව ලියාපදිංචිය දීර්ඝ කිරීම සඳහා ලබාගන්නා අයදුම්පත සම්පූර්ණ කර එම අයදුම්පත සමඟ නියමිත ගාස්තු ගෙවීමෙන් අනතුරුව ලබා ගන්නා රිසිට්පත සහ ශිෂ්‍ය වාර්තා පොත සහකාර ලේඛකාධිකාරි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට 2022/07/15 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ **"ලියාපදිංචිය දීර්ඝ කිරීම - 2016 විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව"** යනුවෙන් සඳහන් සඳහන් කළ යුතුය.

**ලියාපදිංචිය දීර්ඝ කිරීමේ ගාස්තු - එක් වසරක් සඳහා රු.7000.00**

පවත්නා නිර්ණායක අනුව අනුයාත වර්ෂ එකින් එක සඳහා ඔබගේ ලියාපදිංචිය දීර්ඝ කල යුතු වේ.

| ලියාපදිංචිය | ලියාපදිංචි කාලය | ලියාපදිංචි ගාස්තුව |
|---|---|---|
| ලියාපදිංචිය දීර්ඝ කිරීම - I | 2019/11/01 – 2020/10/31 | රු. 7000.00 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම - II | 2020/11/01 – 2021/10/31 | රු. 7000.00 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම - III | 2021/11/01 – 2022/10/31 | රු. 7000.00 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම - IV | 2022/11/01 – 2023/10/31 | රු. 7000.00 |

**සැලකිය යුතුයි**

- **උපාධි I හා උපාධි II කොටස් මේ වන විට සමත්ව ඇති සිසුන් සඳහා පමණක් 2022 ජනවාරි මස පැවැත්වූ උපාධි III පරීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් වූ පසු එහි පුනර් පරීක්ෂණය සඳහා අයදුම් කරන්නේ නම් ඉහත උපදෙස් පරිදි ලියාපදිංචිය දීර්ඝ කර ගත යුතුය.**

- **ඉදිරියට පවත්වන පුනර් පරීක්ෂණ සඳහා අයදුම් කරන්නේ නම් ඒ සඳහා අයදුම් කිරීමට අදාලව පළ කෙරෙන විස්තර පත්‍රිකාවේ එම පරීක්ෂණය සඳහා ඔබගේ අධ්‍යයන වර්ෂයට තිබිය යුතු ලියාපදිංචි වලංගු දිනය දැක්වෙන අතර ඒ අනුව ලියාපදිංචිය දීර්ඝ කර ගත යුතුය.**

- **මෙයට අදාල සියලු ලේඛන external.sjp.ac.lk අපගේ වෙබ් අඩවියෙහි පළ කරනු ලැබේ. වෙබ් අඩවිය පරිශීලනය කිරීම අනිවාර්යය වන අතර තැපැල් මඟින් ලේඛන එවීම සීමා කර ඇත.**

සහකාර ලේඛකාධිකාරි
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය